පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
---------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 26 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 19 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 දෙසැම්බර් 10 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). ලේඛන අනුව සමාලෝචිත වර්ෂයට අදාල තථ්‍ය කඩකුලී බිල්කිරීම රු.4,734,912 ක් වුවද, ආදායම් හා වියදම් ගිණුමට එය රු.5,070,562 ක් ලෙස ගැනීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු.335,650 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ). ඉකුත් වර්ෂයට අදාළ පරිසර තැන්පතු ආදායම් රු.54,000 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාළ පරිසර තැන්පතු ආදායම රු.74,375 ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ඇ). පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදල සඳහා සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු රු.121,032 ක වාරික මුදල් ගිණුම් ගත නොකිරීම නිසා වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. එමෙන්ම ශේෂ සහතික අනුව, වර්ෂ අවසානයට විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු ශේෂය රු.3,222,798 ක් වුවද, ශේෂ පත්‍රයේ එය රු.2,860,475 ක් ලෙස දැක්වීම හේතුවෙන් වර්ෂයට අදාළ ණයහිමියන් රු.362,323 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ). 2012 නොවැම්බර් 01 දින සිට 2013 ජනවාරි 31 දින දක්වා වූ කාලයට අදාලව, 2013 ජූනි මස ලද රු.6,538,956 ක උසාවි දඩ මුදල් ප්‍රමාණයෙන් ඉකුත් වර්ෂයට හා සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රමාණයන් වෙන වෙනම හඳුනා ගැනීමකින් තොරව මුළු ප්‍රමාණයම සමුච්චිත අරමුදලට බැරකර තිබුණි.

(ඉ). වර්ෂ අවසානයට භෞතිකව පවතින තොග ගණනය කිරීමක් සිදුකර නොතිබූ අතර, වර්ෂ අවසාන තොගය ලෙස ඉකුත් වර්ෂයේ පැවති රු.1,963,213 ක ශේෂයම සාවද්‍ය ලෙස මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි.

1.3.2 <u>අසම්භාව්‍ය බැරකම්</u>

ප්‍රාදේශීයසභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයන්ට අදාලව සභාව විසින් එම අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එම අරමුදලට ගෙවිය යුතු ශේෂය රු.2,860,476 ක්ව තිබුණි .

1.3.3 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

සමාලෝචිත වර්ෂයට අදාල අවසාන ශේෂය යටතේ ගිණුම් විෂයයන් 03 කට අදාලව ගිණුම අනුව සහ අදාල ලේඛන අනුව අනුරූපී අගයන් අතර රු .4,334,204 ක නොසැසඳීම් පැවතුණි.

1.3.4 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.67,626,726 ක් වූ අතර, එයින් රු.65,251,726 කට අදාලව කාලවිශ්ලේෂණ ඉදිරිපත් නොවුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂ වල වටිනාකම රු.55,105,798 ක් වූ අතර එයින් රු.8,353,385 ක් වසර 3 කට වඩා පැරණි ශේෂයන් විය.

1.3.5 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු .12,021,201 ක ගනුදෙනු පිළිබඳව විස්තරාත්මක පරීක්ෂාවක් කළ නොහැකි විය.

02. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,902,422 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.10,042,545 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.23,944,967 ක වර්ධනයක් පැවතුණි. මෙකී මූල්‍ය ප්‍රතිඵලයට රු.42,697,236 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.55,554,426 ක් වූ ප්‍රාග්ධන වියදම් ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල අතිරික්තය රු.1,045,232 දක්වා අඩුවී තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයට අදාලව සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.74,961,826 න් සියයට 53 ක් ලෙස රු.40,001,752 ක් උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම්වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.42,697,236 ක මුළු ප්‍රමාණයම මගනැගුම, පළාත් ආයෝජන, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශ ආධාර වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් සභා බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල් විය.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන වියදම වූ රු.61,059,404 න් සියයට 51 ක් ලෙස රු.31,132,761 ක් පෞද්ගලික පඩිනඩි සඳහා වියදම වන අතර, ඉන් සියයට 70 ක් ලෙස රු.21,872,469 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.55,554,426 න් සියයට 18 ක් ලෙස රු.9,898,685 ක් පමණක් සභා අරමුදල් වැය වී තිබුණු අතර, ඉතිරි සියයට 82 ක් වූ රු.45,655,741 ක ප්‍රමාණය මගනැගුම, පළාත් ආයෝජන, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශ ආධාර වැනි ප්‍රභව මත වෙනත් ආයතන ප්‍රතිපාදනවලින් ඉටුකළ සංවර්ධන කාර්යයන් විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

වෙළඳ බලපත්‍ර, ව්‍යාපාර බදු, කඩකුලී, බදුකුලී වැනි ආදායම් ක්ෂේත්‍රයේදී එකතු කිරිම සඳහා නිශ්චිත බලයක් නොතිබුණ ද, සභාවේ ආදායම් එකතු කරන්නන් විසින් වර්ෂය පුරාම වරිපනම් බදු හා වෙළඳ බලපත්‍ර වැනි ආදායම් ද ක්ෂේත්‍රයේදී එකතු කර තිබුණි.

2.3.2 වරිපනම් බදු

1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති 32-42 දක්වා වූ රීතින් ප්‍රකාරව කාර්තු පදනම් කරගෙන හිඟ ලැයිස්තු සකස් කර, අදාල නිවේදන නිකුත් කිරීමෙන් පසු දේපළ තහනමට ගෙන හිඟ වරිපනම් බදු අයකිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කළ යුතු විය. එහෙත් වරිපනම් බදු නිවේදන බෙදාදීම හා ක්ෂේත්‍රයේ ආදායම් එකතු කිරීම් වැනි ක්‍රියාමාර්ග පමණක් සිදු කර තිබුණි.

2.3.3 බදු කුලී

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයට අදාලව අවම ලංසුව රු.988,945 ක් වූ වත්කම් විෂයයන් 30 ක් සඳහා තුන්වරක් මිල කැඳවීම් සිදු කර තිබුණද බදුදීමට නොහැකි වී තිබුණි.

(ආ). හෙට්ටිපොල කුකුළු මස් කඩයෙහි 2007 වර්ෂයට අදාල රු.41,975 ක හිඟයක් පැවතිණි.

(ඇ) හෙට්ටිපොල ගවමස් කඩයෙහි 2006 වර්ෂයට අදාලව පැවති රු.151,125 ක හිඟය සඳහා වූ නඩු තීන්දුව අනුව බදුකරුගේ දේපළ විකුණා අදාල මුදල් අයකර ගැනීමට නියෝග කර තිබුණද එකී මුදල් අයකර ගෙන නොතිබුණි. මඩිගේ අනුක්කනේ ගවමස් කඩයෙහි 2006 හා 2007 වර්ෂවලට අදාලව පැවති රු.146,020 ක හිඟ සම්බන්ධයෙන් වූ නඩුවෙහි බදුකරු විදේශ ගතවී ඇති බව ලිපිගොනු අනුව වාර්තා වී තිබුණ ද ඒ සම්බන්ධව පසු විපරමක් සිදුකර නොතිබුණි.

(ඈ) 2012 වර්ෂයේ බදු දී තිබූ පණ්ඩුකපුර කඩ කාමර 5 න් 3 ක් වෙනුවෙන් රු.63,259 ක කුලී මුදල් හිඟව පැවති අතර, පඩුවස්නුවර කඩ කාමර 3 ක බදුකරුවන් 2012 අප්‍රේල් මස වන විට කඩ අතහැර ගොස් තිබුණි. ඉන්පසු වෙනත් පුද්ගලයකු විසින් එකී කඩ 3 ක් භාවිතා කර තිබුණද එම පුද්ගලයා හා සභාව අතර කඩ කුලී සම්බන්ධව ගිවිසුමක්ද නොවීය. එහෙත් සභාව ඊට අදාලව මාසිකව බිල්කිරීම් සිදුකර තිබීම හේතුවෙන් එකී කඩවලට අදාලව රු.63,255 ක හිඟ ශේෂයක් පැන නැගී තිබුණි. කෙසේ වුවද මෙම කඩ කාමරවලට අදාලව ලිඛිත ගිවිසුම් නොමැතිවීමෙන් අදාල හිඟයන් සම්බන්ධව නෛතික ක්‍රියාමාර්ග ගත නොහැකි තත්ත්වයක් උදා වී තිබුණි.

(ඉ) හෙට්ටිපොල නව වෙළඳ සංකීර්ණයේ අංක 12 දරන කඩ කාමරය සඳහා පුද්ගලයන් දෙදෙනෙකු විසින් රු.776,000 හා රු.693,100 බැගින් වූ මිල ගණන් ඉදිරිපත් කර තිබුණද ටෙන්ඩරය පිරිනැමීමේදී නිශ්චිත හේතුවක් නොදන්වා දෙවන මිල ගණන වූ රු.693,100 සභාව පිළිගෙන තිබුණි. එම කඩය වෙනුවෙන් 2012 වර්ෂය අවසානය වන විටත් ගිවිසුම් අත්සන් කර නොතිබූ අතර, 2013 වර්ෂයේදී රු.776,000 ක මිල ගණනක් ඉදිරිපත්කළ ගැනුම්කරු සමඟ රු.693,100 ක මිළටම ගිවිසුම් ගත කුලී මුදල් අයකර තිබුණි.

(ඊ) ආසියානු සංවර්ධන ව්‍යාපෘති ණය ආධාර යටතේ රු.41,128,218 ක් වැයකර 2011 වර්ෂයේ ඉදිකර තිබූ බහුකාර්ය ගොඩනැගිල්ලෙහි පැවති කඩ කාමර 9 ක් සඳහා 2013 වර්ෂය අවසාන වන විටද කුලී තක්සේරු වාර්තා ලබාගෙන නොතිබුණි. එසේම එම කඩ කාමර බදු දීමේදී ටෙන්ඩර් පරිපාටියද අදාල කරගෙන නොතිබුණි. එලෙස ලංකා බැංකුවට ලබාදී තිබුණු කඩ කාමර 2 ක් හා සම්පත් බැංකුවට ලබාදී තිබුණු එක් කඩ කාමරයක් වෙනුවෙන් ගිවිසුම් අත්සන් කර ආරක්ෂිත ඇප මුදලක් ලබාගෙන නොතිබුණි. එමෙන්ම වර්ග අඩි 923 ක් පමණ වූ එක් කඩ කාමරයක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිශ්චිත කාර්යයකට යොදවා නොතිබුණි.

2.3.4 ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ රීති 59 - 67 දක්වා ඇති පරිදි සභා බල ප්‍රදේශය තුල සමීක්ෂණයක් පවත්වා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(1) හා 152(1) වගන්ති ප්‍රකාරව, කර්මාන්ත හිමියන් හා වෙළඳ ව්‍යාපාරිකයන් වෙත දින 7 ක් ඇතුලත පනවන බද්ද ගෙවන ලෙස නියම කරමින් ප්‍රා.ස. 26 B ආකෘතිය ප්‍රකාරව නිවේදනය කර නොතිබුණි.

2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ ප්‍රමාණය රු.2,683,995 ක් විය.

2.3.6 ජල ගාස්තු

-------------

(අ). සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් මස අවසානය වන විට ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් ජල ඒකක 93,415 ක් සභාව විසින් මිලදී ගෙන තිබූ අතර, එම කාලයට අදාල ඒකක 58,973 ක් සඳහා පමණක් සභාව විසින් බිල්කර තිබීම හේතුවෙන් ඒකක 34,442 ක වෙනසක් නිරීක්ෂණය විය. එය තොග ගැනුම් මිල හා සැසඳීමේදී රු.619,956 ක අගයක් විය.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාල ජල බිල්කිරීම රු.2,571,407 ක් වූ අතර, වර්ෂය අවසානයට හිඟ ජල ගාස්තු රු.1,277,940 ක් විය. විගණනයේදී සිදුකළ නියැදි පරික්ෂාවට අනුව එම වටිනාකම තුල රු.5,000 ට වැඩි හිඟ ශේෂයන් 20 ක් පැවති අතර එහි එකතු වටිනාකම රු.266,063 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධන ඇගයීම

සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළ ඉටුකිරීමට සැලසුම් කර තිබූ රු.738,000 ක් වටිනා සුභසාධන කාර්යයන් 05 ක් හා රු.23,800,000 ක් වටිනා සංවර්ධන කාර්යයන් 05 ක් ඉටුකර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 1993 වර්ෂයේදී වයඹ ප්‍රාදේශීය ගමනා ගමන මණ්ඩලය විසින් සභාවට පවරන ලද ඉඩමක පිහිටි ගොඩනැගිල්ලක බාහිර පුද්ගලයකු විසින් අනවසර ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යමින් පැවති අතර, ඒ සම්බන්ධව 2010 වර්ෂයේ සිට පැවති නඩුව මෙතෙක් නිරවුල් වී නොතිබුණි. තවද, කිසිදු කුලී මුදලක් නොගෙවා අදාල පුද්ගලයා විසින් ව්‍යාපාර කටයුතු කරගෙන යමින් පැවති බව නිරීක්ෂණය විය. එමෙන්ම සභාවට අයත් වලව්වත්ත ඉඩමේ පොදු පහසුකම් සඳහා වූ පර්චස් 49 ක බිම් කොටසේ අනවසර පදිංචිකරුවෙකු ඉවත් කිරීමට අදාලව 1996 වර්ෂයේ සිට පවතින නඩුව ද විගණන අවස්ථාව දක්වාම සමථයකට පත් වී නොතිබුණි.

(ආ). සභාව විසින් 2007-2009 කාලය තුළ අනුමත කළ ගොඩනැගිලි අයදුම්පත් 308 න් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අනුකූලතා සහතික ලබා නොගත් ස්ථාන 298 ක් පැවතිණි. අදාල ගොඩනැගිලි සියල්ල ඉදිකර තිබුණේ නම් සභා අතුරු ව්‍යවස්ථා අනුව රු.894,000 ක අනුකූලතා සහතික ආදායමක්ද, ගොඩනැගිලි ඉදිකර අවසන්ව නොමැති නම් බලපත්‍ර කාලය දීර්ඝ කරවා ගැනීමෙන් සභාවට රු.785,500 ක ආදායමක්ද අයකර ගත හැකිව තිබුණද සභාවේ අවධානය ඒ සඳහා යොමුව නොතිබුණි.

(ඇ). වර්ෂ ගණනාවක සිට අයනොවී පවතින දැනට සේවයේ නොමැති සේවකයින් 18 කගේ සේවක ණය ශේෂය රු.134,956 ක් වූ අතර, ස්ථාන මාරුවී ගිය සේවකයන් 04 දෙනෙකුට අදාලව අයනොවන ණය ශේෂය රු.214,622 ක් විය.

3.3 <u>වත්කම් කළමනාකරණය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). 2011 වර්ෂයේදී රු.275,500 ක් වැයකර මිලදීගෙන තිබුණු කොන්ක්‍රීට් ගල් නිෂ්පාදන යන්ත්‍ර 2 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අදාල කාර්යයකට නොයොදවා නිෂ්කාර්යව පැවතුණි.

(ආ). හෙට්ටිපොල කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානය පවත්වාගෙන යන ඉඩමෙහි අයිතිය සභාව සතු වුවද, පෞද්ගලික පාර්ශවයන් විසින් එම ඉඩමේ ගොඩනැගිල්ලක් ඉදිකර 2013 වර්ෂය අවසානය දක්වා ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන ගොස් තිබුණි. එහෙත් 2014 වර්ෂයට ටෙන්ඩර් කිරීමේදී වෙනත් පාර්ශවයක් විසින් ටෙන්ඩරය වාර්ෂිකව රු.14,550 කට බදු ගෙන තිබුණද, එකී දේපළෙහි ව්‍යාපාර කටයුතු කරගෙන යාමට නව බදුකරුට අවස්ථාව සලසා දීමට සභාව අපොහොසත් වී තිබුණි. එමෙන්ම සභාව විසින් අදාල ඉඩමේ හා ගොඩනැගිල්ලෙහි අයිතියද තහවුරු කරගෙන නොතිබුණි.

3.4 <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>

සභාව සතුව කසල කළමනාකරණ ව්‍යාපෘතියක් නොමැති අතර, ප්‍රදේශයේ රැස්කරනු ලබන කසල පෞද්ගලික ඉඩම්වල වළ දැමීමේ ක්‍රමයක් සභාව අනුගමනය කරමින් පැවතුණි.

04. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>

4.1 <u>අයවැය ලේඛනමය පාලනය</u>

සමාලෝචිත වර්ෂයට අදාල අයවැය ලේඛනය අනුව, පුනරාවර්තන වියදම් සඳහා රු.74,435,000 ක ප්‍රතිපාදනයක් පැවතියද ඉන් සියයට 82 ක් ලෙස රු.61,056,000 ක් වැයකර පැවතුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම් යටතේ රු.73,910,000 ක ඇස්තමේන්තුවක් පැවතියද, ඉන් සියයට 75 ක් ලෙස රු.55,554,000 ක් පමණක් වැයකර පැවතුණි.

05. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). අයවැය පාලනය

(ඇ). මූල්‍ය පාලනය

(ඈ). ආදායම් පරිපාලනය